# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2217/37 - 2021 මාර්තු මස 05 වැනි සිකුරාදා - 2021.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර, තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මගින් සම්මත කරනු ලැබ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද එකී තීරණයන් පහත උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පඩිපාලක සභා ආඥා පනතේ 29(3) වන වගන්තියෙහි විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2021 මාර්තු මස 05 දින සිට වලංගු විය යුතු ය.

**එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2021 මාර්තු මස 03 වැනි දින,
මෙහෙවර පියෙස,
කොළඹ 05.

උපලේඛනය

තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1945 ජූලි මස 31 වැනි දින අංක 9441 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2014 ජූලි 24 දින අංක 1872/31 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරන ලද්දාවූ එකී II වන කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

II වන කොටස

කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු

| | | |
|---|---|---|
| i. | අවම දෛනික වේතන ප්‍රමාණය (කම්කරු) | රු.900.00 |
| ii. | අයවැය සහන දීමනාව | රු.100.00 |

03 - 571/1


1A - G 33870 — 35 (2021/03)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර, රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව මගින් සම්මත කරනු ලැබ ගරු කම්කරු අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද එකී තීරණයන් පහත උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට පඩිපාලක සභා ආඥා පනතේ 29(3) වන වගන්තියෙහි විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2021 මාර්තු මස 05 දින සිට වලංගු විය යුතු ය.

**එම්. පී. ඩී. යූ. කේ. මාපා පතිරණ,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය.

2021 මාර්තු මස 03 වැනි දින,
මෙහෙවර පියෙස,
කොළඹ 05.

උපලේඛනය

රබර් වැවීමේ හා දළ රබර් නිපදවීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව 1949 නොවැම්බර් මස 25 වැනි දින අංක 10047 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, වරින් වර වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට 2014 සැප්තැම්බර් 26 දින අංක 1881/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දා වූද තීරණවල II වන කොටසේ අවම දෛනික වේතන ප්‍රමාණය වෙනුවට පහත සඳහන් කොටස අලුතින් ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතු ය.

II වන කොටස

කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු

| | | |
|---|---|---|
| i. | අවම දෛනික වේතන ප්‍රමාණය (කම්කරු) | රු.900.00 |
| ii. | අයවැය සහන දීමනාව | රු.100.00 |

03 - 571/2